# රාජ්‍ය දැව සංස්ථාව

පරිසර හා වනජීවි සම්පත් අමාත්‍යාංශය

## ලංසු සඳහා ආරාධනාවයි

1. රාජ්‍ය දැව සංස්ථාව වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා මුද්‍රිත මිල ගණන් කැඳවනු ලැබේ.

| ලංසු අංක | ලංසු නාමය හා ස්ථානය | ඇස්තමේන්තු කල පිරිවැය (අවිනිශ්චිත වියදම් සහිත හා බදු රහිත) රු.මිලියන | ICTAD වර්ගීකරණය | ලංසු බැදුම්කරයේ වටිනාකම හා ලබා දිය යුතු කාලය | ආපසු නොගෙවන තැන්පතුව |
|---|---|---|---|---|---|
| STC/04/CE /258 | මිදලන දැව ගබඩා පරිශ්‍රයේ යෝජිත සහකාර කළමණාකාර කාර්යාලය හා ගබඩා නිළධාරි කාර්යාලය ඉදිකිරීම. රාජ්‍ය දැව සංස්ථාව, මොරපිටිය, මිදලන,රත්නපුර | 11.34 | C6, C5 සහ C4 ගොඩනැගිලි සඳහා CIDA ලියාපදිංචිය | 115,000.00 දින 119 | 2,000.00 |
| STC/04/CE /Con/170 | ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාරයේ උපාංග ගබඩා කිරීම සඳහා යකඩින් ගොඩනැගිල්ලක් ඉදි කිරීම. රාජ්‍ය දැව සංස්ථාව, වරාපිටිය, කුණ්ඩසාලේ මහනුවර. | 3.28 | C8, C7 සහ C6 යකඩ / ගොඩනැගිලි සඳහා CIDA ලියාපදිංචිය | 33 ,000.00 දින 105 | 1,000.00 |
| STC/04/CE /171 | දැව පදම් කිරීමේ ගොඩනැගිල්ල දිගු කිරීම සඳහා කොටසක් එකතු කිරීම ගෘහ භාණ්ඩ සංකීර්ණය, රාජ්‍ය දැව සංස්ථාව, අම්පාර. | 2.17 | C8, C7 සහ C6 යකඩ / ගොඩනැගිලි සඳහා CIDA ලියාපදිංචිය | 22,000.00 දින 91 | 1,000.00 |

2. ලංසු කැඳවීම ජාතික තරගකාරි ලංසු ක්‍රමය ( NCB ) මගින් සිදු කරනු ලැබේ.
3. මේ සම්බන්ධව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නිෂ්පාදන හා ඉංජිනේරු ) වෙත යොමු කර ලිඛිතව ඉල්ලුම් කිරීමෙන් හා ඉහත සඳහන් ආපසු නොගෙවන මුදල, රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති වෙත මුදලින් පමණක් ගෙවීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස්කර ඇති අදාල ලංසු කැඳවීමේ ලේඛණ කට්ටලයක් 2021.12.07 දින සිට 2021.12.27. වන දින දක්වා සතියේ රාජකාරි දින වල පෙ.ව. 09.00 සිට ප.ව 03.00 දක්වා මිලදී ගත හැකිය.
4. වෙන වෙනම මුද්‍රා තැබූ නිසියාකාරව සම්පූර්ණ කරන ලද ලංසුව හා එහි පිටපත මුද්‍රා තබන ලද තනිකවරයක නැවත බහා රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් හෝ සභාපති, රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් 2021.12.28 දින පෙ.ව. 10.30ට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම 2021.12.28 වන දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයකුට සහභාගී විය හැකිය.
5. ඉහත වගුවේ සඳහන් පරිදි සියළුම ලංසු බැදුම්කර,පිළිගත් වානිජ බැංකුවකින් හෝ ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලින් ලබා ගත් ලංසු බැදුම්කරයක්විය යුතු අතර එම බැදුම්කරවල “කොන්දේසි විරහිත හා ඉල්ලූ විට ගෙවීම” යන්න සඳහන් විය යුතුය. මෙහි සම්මත ආකෘති පත්‍රය, ලංසු ලියකිවිලි සමග අමුණා ඇත. නියමිත ආකෘතියට පරිබාහිරව ඇති සියළුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
6. 2021.01.11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛණ අංක 03/2020(i) යටතේ මූල්‍යාමය වශයෙන් ඇගයීමේදී එහි සඳහන් කරුණු අනුව ඇගයීම් කරනු ලැබේ.
7. මේ සම්බන්ධව උනන්දුවක් දක්වන හා සුදුසුකම්ලත් ලංසුකරුවන්ට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නිෂ්පාදන හා ඉංජිනේරු), අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන කාර්යාලයෙන් 2021.12.07 දින සිට 2021.12.27 වන දින දක්වා සතියේ රාජකාරි දින වල පෙ.ව. 09.00 සිට ප.ව 03.00 දක්වා ලංසු ලිපි ලේඛණ පරික්ෂා කල හැකිය. දුරකථන අංක **011 2866614**

**සභාපති,**

**රාජ්‍ය දැව සංස්ථාව,**

**අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.**